# ජාතික ලුණු සමාගම

## කර්මාන්ත අමාත්‍යාංශය

ජාතික ලුණු සමාගම යනු, කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන, රජය සතු සමාගමකි. සමාගමේ මන්නාරම ලුණුලේවායේ පවත්නා පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරු - ලුණු ලේවාය (MM1-1)**

**(තනතුරු 01 - මන්නාරම ලුණු ලේවාය)**

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා හෝ ඉංජිනේරු ක්ෂේත්‍රයේ උපාධියක් හෝ තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ NVQ සුදුසුකම් 7 තලයේ ප්‍රවීනතා සහතිකයක් සහ ප්‍රථම උපාධිය ලබාගත් පසුව, රජයේ හෝ පිළිගත් ආයතනයක, තනතුරට අදාළව, ලුණු ලේවායක හෝ වෙනත් ආශ්‍රිත කර්මාන්තයක අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙනින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබිය යුතුය.

හෝ

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකරු (JM) වර්ගීකරණයේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :** MM 1-1 - GR-11-2016 රුපියල් (53,175-10X1,375-15X1,910-95,575) හා අනෙකුත් රජයේ අනුමත දීමනා.

**පොදු කරුණු :**

**ස්ථිර සේවකයන්හට වයස් සීමාව :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර හෝ රජයේ ස්ථිර නිලධාරීන්හට අදාළ නොවේ.

**වෙනත් :**

**සෑම අයදුම්කරුවකුම**

i) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii) තනතුරට අදාළ රාජකාරි නිසිලෙස ඉටුකිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි වනසේ මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් යුක්ත විය යුතුය.

iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. (අදාළ පරිවාස කාලය අවුරුදු තුනකි).

කරුණාකර, ඔබගේ ජීවදත්ත සහිත අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත, 2023-03-27 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ තනතුරේ නාමය සඳහන් කළ යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**

**ජාතික ලුණු සමාගම,**

**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**